# ඇබෑර්තු

## ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI)

### තාක්ෂණ අමාත්‍යාංශය

### අධ්‍යක්ෂ තනතුර - ජ්‍යෙෂ්ඨ කළමනාකරු සේවා ගණය (HM 1-3)

## අධ්‍යක්ෂ තනතුර (පරිපාලන) - 01

**සුදුසුකම්**

**බාහිර**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් කළමනාකරණ, රාජ්‍ය පරිපාලන, රාජ්‍ය කළමනාකරණ, ව්‍යාපාර පරිපාලන හෝ මානව සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රයේ (වසර හතරක) ප්‍රථම උපාධියක්.

සමග

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ, රාජ්‍ය කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය ලබාතිබීම.

**තනතුරට අදාළ පළපුරුද්ද**

සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව "කළමනාකරණ තලයේ" අවම වසර පහළොවක (15) අදාළ පළපුරුද්ද තිබියයුතු අතර, ඉන් වසර 02 ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය. ඒ සමග සතෘට කළ සේවා වාර්තාවක් සතු විය යුතුය.

සහ

සතෘට කළ බහුවිධ ක්ෂේත්‍රයන්හි කණ්ඩායම්වලට නායකත්වය ලබාදීමේ හා දිසානති කිරීමේ සතෘට කළ හැකියාව සමග මානව හා වෙනත් සම්පත් සුදුසු පරිදි සේවයේ යෙදවීම හා කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධ පළපුරුද්ද තිබිය යුතුය.

**අභ්‍යන්තර (පහත 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

2) ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක සේවා පළපුරුද්ද සමග, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලන, මානව සම්පත් කළමනාකරණ, කළමනාකරණ හෝ රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් (මාස්ටර්ස්) උපාධියක් හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක වරලත් සාමාජිකත්වය ලබා තිබීම.

සහ

ඔබ යොදවන ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්දක් සහ කණ්ඩායම්වලට නායකත්වය ලබාදීමේ හා නියෝග කිරීමේ සාධනීය හැකියාව සමග මානව සම්පත් සුදුසු පරිදි කළමනාකරණ කිරීමේ හැකියාව තිබිය යුතුය.

තෝරාගත් අයදුම්කරු පරිපාලන අංශයේ ප්‍රධානී ලෙස කටයුතු කළ යුතු අතර, ආයතනයේ පරිපාලන කාර්යයන් පිළිබඳව වගකීම දරයි. ඔහු / ඇය, සතුව, සියලු තලයන්හි කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් විශිෂ්ඨ නායකත්ව හා සන්නිවේදන කුසලතා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය** ශ්‍රී ලංකා රුපියල් 86,865.00 - 15X2,270.00 - 120,915.00

**වයස** අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නැත.)

**වෙනත් ප්‍රතිලාභ**

1. නිවසේ සිට කාර්යාලය දක්වා, නිර්දිෂ්ඨ දුරකට, ප්‍රවාහන පහසුකම් ලබාදේ.
2. ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම.
3. ජීවිත රක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණ ආවරණය
4. සීමාවකට යටත්ව වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය.
5. මහා භාණ්ඩාගාරය විසින් අනුමත කළ වාර්ෂික දිරි දීමනාව.
6. වෘත්තීය වටපිටාවක සේවය කිරීමේ අවස්ථාව
7. වෘත්තීය දීමනාව.
8. සන්නිවේදන දීමනාව.

තමන්ගේ සම්පූර්ණ නම, වයස, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් අදාළ විස්තර සමග අදාළ සහතිකවල පිටපත් සහිතව ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නාමයන් හා ලිපිනයන් ඇතුළත්ව සකස් කළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, 2023-11-06 දිනට පෙර, **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**

**දුරකථනය - 011-2671567-72**